නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

வீடமைபபு நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

Ministry of Housing,Construction &Cultural Affairs

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය

ஆண்டறிக்கையும் நிதிசார் கூற்றுக்களும்

Annual Report And Financial Statements

2019

ටවර් හෝල් රඟහල පදනම

டவர் மண்டப அரங்க மன்றம்

Tower Hall Theatre Foundation

පටුන

පිටුව

1. දැක්ම, මෙහෙවර, අරමුණ හා පරමාර්ථ 01
2. ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලය 02-03
3. පාලන හා සංවර්ධන අංශය 05-08
    a. ටවර් හෝල් රඟහල පදනම මාණ්ඩලික නිළධාරීන්
    b. අනුමත කාර්ය මණ්ඩලය සහ 2019.12.31 දිනට කාර්ය මණ්ඩලය
    c. ඉල්ලා අස්වීම්,කොන්ත්‍රාත් කාලය අවසන් වීම්, පුහුණු පාඨමාලා සහභාගී වූ කාර්ය මණ්ඩල
    d. රංග ශාලා නවීකරණය සහ සංවර්ධනය
4. නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන් අංශය 09
5. 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් 10-23
6. මුදල් අංශය 24
    a. විගණකාධිපති වාර්තාව 25 - 33
    b. අවසන් මූල්‍ය ප්‍රකාශය 34 -54
7. ස්තූතිය 55



ටවර් හෝල් රඟහල පදනම

දැක්ම

“ශ්‍රී ලංකාවේ ජාතික නාට්‍ය මධ්‍යස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා පුරෝගාමී ආයතනය බවට පත්වීම”

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහිකිරීමට සහ ප්‍රවර්ධනයට දායක වෙමින් ඒ සඳහා අවශ්‍ය දැනුම යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංගකලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබා ගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් නාට්‍ය හා රංගකලා නිර්මාණවේදීන් දිරිගන්වමින් රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම.

අරමුණු හා පරමාර්ථ

(අ) ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ආ) රඟහල පිළිබඳ දැනුම අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.

(ඇ) රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහය වීම.

(ඈ) ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ ඒවා රඟදැක්වීමේ නියුතු වීම.

(ඉ) පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගතයුතුවන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහාද සුදුසුයැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම,පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම

හැදින්වීම

ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම හා ටවර් හෝල් රඟහල ජාතික රඟහලක් ලෙස ප්‍රයෝජනයට ගැනීම මුඛ්‍ය පරමාර්ථය කොට නාට්‍ය හා රංග කලාව වෙනුවෙන් ස්ථාපිත අනෙකුත් අරමුණු හා පරමාර්ථයන් පෙරදැරි කර ගෙන 1978 අංක 01 දරණ ටවර් හෝල් රඟහල පදනම පනතින් ස්ථාපිත කරන ලද ටවර් හෝල් රඟහල පදනම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු නිලබලයෙන් පත්වන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමා

විසින් තුන් අවුරුදු කාලයක් සඳහා පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් පරිපාලනය කරනු ලැබේ.

ටවර් හෝල් රහහල පදනම භාරකාර මණ්ඩලය2019 -

නිල බලයෙන් පත්වන සාමාජිකවරු

01 ටවර් හෝල් රහහල පදනමේ සභාපති/
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
රනිල් වික්‍රමසිංහ මැතිතුමා - 2015.01. 09– 2019.11.20

ටවර් හෝල් රහහල පදනමේ සභාපති/
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා - 2019.11.21 දින සිට

02 නිවාසඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය , - 2019.11.21 දක්වා
සජිත් ප්‍රේමදාස මැතිතුමා

බුද්ධශාසනසංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය ,
මහින්ද රාජපක්ෂ මැතිතුමා - 2019.11.27 දින සිට

03 මුදල් ගරු අමාත්‍ය, මංගල සමරවීර මැතිතුමා - 2019.11.21 දක්වා

මුදල් ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා - 2019.11.27 දින සිට

04 අභ්‍යන්තරස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍ය ,
වජිර අබේවර්ධන මැතිතුමා - 2019.11.21 දක්වා

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් ,ස්වදේශ කටයුතු , - 2019.11.27 දින සිට
පාලන ගරු අමාත්‍ය
ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා

05 අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා - 2018.12. 16– 2019.11.20
අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත් මහතා - 2019.11.21 දින සිට

06 නිවාසඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ,- 2019 මාර්තු මස සිට
බර්නාඩ් වසන්ත මහතා 2019 නොවැම්බර් දක්වා

බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ,
එම් .කේ.බන්දුල හරිස්චන්ද්‍ර මහතා - 2019.12.01 දින සිට

07අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් පද්මසිරි ජයමාන්න මහතා - 2018.12. 21– 2019.03.22
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එන් රණසිංහ මහතා .එම්. .2019 -04.01 2019 – දෙසැම්බර් දක්වා
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එන්2019 - චිත්‍රානන්ද මහතා .එම්.එච්. දෙසැම්බර් සිට

08 සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ අනූෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය

09 කොළඹ මහ නගර සභාවේ ගරු නගරාධිපතිනී රෝසී සේනානායක මහත්මිය

10 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්
වී.කේ. ඒ .අනුර මහතා - 2018.08. 06- 2019.07.10
පාලිත නානායක්කාර මහතා - 2019.07. 10- 2020 ජනවාරි මස දක්වා

<u>ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත්කරන සාමාජිකවරු</u>

<u>(පත්වීමේ දින සිට වසර 03ක කාලයක් සඳහා)</u>

01 මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතා
02 ලූෂන් බුලත්සිංහල මහතා
03 ජෙරෝම් ද සිල්වා මහතා
04 පුරප්පාඩුව පවතී.
05 පුරප්පාඩුව පවතී.

මහා භාණ්ඩාගාර නියෝජනය -ඉනෝකා ලංකාතිලක මහත්මිය සහකාර අධ්‍යක්ෂ ,මහා භාණ්ඩාගාරය

ආචාර්ය ගාමිණී කාරියවසම් මහතා ,අධ්‍යක්ෂ ජනරාල් ,ටවර් හෝල් රඟහල පදනම .
2019 –.01. 14– 2019.12.06
නිපුණ දිසානායක මහතා , අධ්‍යක්ෂ ජනරාල් රාජකාරී ආවරණය
2019.12.12 සිට 2020.01.02 දක්වා

පාලන හා සංවර්ධන අංශය

ටවර් හෝල් රඟහල පදනම

ජ්‍යෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්

1. අධ්‍යක්ෂ ජනරාල් - ආචාර්ය ගාමිණි කාරියවසම් මහතා

2.අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්) - සමන් සොයිසා මහතා

3. අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) වැ.බ හා - නිපුණ දිසානායක මහතා
සහකාර අධ්‍යක්ෂ (පාලන සංවර්ධන)

4. සහකාර අධ්‍යක්ෂ (මුදල්) - ඉන්දික ජයමිණි පරණගමගේමහතා

5. සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) - සම්පත් පෙරේරා මහතා

6. සහකාර අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන - චන්දන බණ්ඩාර මහතා
හා වැඩසටහන්)

7 සහකාර අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) - ෂන්මුග ෂර්මා ජයප්‍රකාශ් මහතා

අනුමත කාර්ය මණ්ඩලය හා සිටින කාර්ය මණ්ඩලය 2019.12.31 දිනට

සේවා ගණය	වැටුප් **කේත** අංකය	අංකය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	HM-2-1	1	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
	HM-1-1	2	අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	0	1
		3	අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන,අධ්‍යාපන භාවැඩසටහන්)	1	1	0
	MM-1-1	4	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)	1	1	0
		5	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	1	1	
		6	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ)	1	1	0
		7	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන්)	1	1	0
		8	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන)	1	1	0
කෘතිය මට්ටම	JM-1-1	9	පරිපාලන නිලධාරී	1	1	0
		10	කළමනාකරු (රහභල්)	3	3	0
		11	අභ්‍යන්තර විගණන නිලධාරී	1	1	0
	MA-4	12	සංවර්ධන සහකාර (අලෙවි)	1	1	0
		13	සංවර්ධන සහකාර (ගිණුම් හා මූල්‍ය)	1	1	0
		14	සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා)	1	1	0
		15	සම්බන්ධීකරණ නිලධාරී (වැඩසටහන් හා ප්‍රචාරණ)	1	1	0
		16	සම්බන්ධීකරණ නිලධාරී (සුභ සාධන)	1	1	0
		17	ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක	1	0	1
ද්විතීය මට්ටම	MA-2-1	18	වැඩ මූලික සිවිල්	1	1	0
		19	තාක්ෂණික සහකාර	1	0	1
		20	ශබ්ද පරිපාලක	1	0	1
		21	පොත් තබන්නා	1	1	0
	MA-1-1	22	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	26	24	2
		23	කළමනාකරණ සහකාර (මුදල් අයකැමි)	1	1	0
		24	කළමනාකරණ සහකාර (දෙමළ භාෂිත)	1	1	0
ප්‍රාථමික මට්ටම	PL-3	25	රියැදුරු	6	6	0
		26	විදුලි කාර්මික ශිල්පී	1	1	0
		27	ශබ්ද ක්‍රියාකරු	4	2	2
		28	රංගාලෝක ශිල්පී	3	2	1
		29	නඩත්තුරු	1	0	1
	PL-2	30	රංගාලෝක ශිල්පී සහායක	3	0	3
	PL-1	31	කාර්යාල සහායක	7	6	1
		32	රංගශාලා සහායක	8	8	0
		33	පාලන මැදිරි සහායක	1	1	0
		34	රංග සේවා මැදිරි සහායක	1	1	0
		35	කෞතුකාගාර/ ලේඛනාගාර සහායක	1	1	0
		36	ශබ්ද ක්‍රියාකරු සහායක	3	3	0
		37	පොත් අලෙවිහල සහායක	1	1	0
			අනුමත එකතුව -	91	77	14

පුද්ගලික වන සේ ඇති තනතුරු - දැනට සේවයේ යෙදෙන

ද්විතීයික මට්ටම ප්‍රථමික මට්ටම	MA 2-1	1	පරිගණක ක්‍රියාකරු		1
	PL 3	2	සම්බන්ධීකාරක (සංගීත)		1
	PL 2	3	කළමනාකාර සහායක		2
	මුළු එකතුව				**81**

2019 වර්ෂය

පුහුණු හා පාඨමාලා සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලය

පුහුණු හා පාඨමාලාවේ නම	*කාල සීමාව*	*සහභාගී වූ ගණන*
පරිගණක දුරස්ථඅධ්‍යාපන පාඨමාලාව	මාස 06	24 දෙනෙකු
නිවේදන කටයුතු පුහුණු පාඨමාලාව	එක් දින	නිවේදන කටයුතු වලට කැමති කාර්ය මණ්ඩලය වෙනුවෙන්
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ	එක් දින	සියලු කාර්ය මණ්ඩලය
ධනාත්මක ආකල්ප වර්ධනය	එක්දින	සියලු කාර්ය මණ්ඩලය
කළමණාකරණ සහකාරවරුන්ගේ කාර්යභාරය	එක්දින	සියලු MAකාර්ය මණ්ඩලය
ගුණාත්මක රාජ්‍ය සේවයක් සඳහා වැඩමුලුව	එක්දින	සියලු කාර්ය මණ්ඩලය
(මාසිකව සියලු කාර්යමණ්ඩලය සඳහා එක්දින මෙම වැඩමුලුව පවත්වන ලදී.)		
ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය	තෙදින	නිළධාරීන් තිදෙනෙකු

රංග ශාලා නවීකරණය සහ සංවර්ධනය

එල්ෆින්ස්ටන් රංග ශාලාව

වසර අවුරුදු 90 කට වඩා පැරණි එල්ෆින්ටන් රංග ශාලාව නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නවීන තාක්ෂණය එක්කරමින් සහ ගොඩනැගිල්ල තවත් අවුරුදු සිය ගණනක් ඉදිරියට පවත්වා ගැනීමේ අරමුණින් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ උපදෙස් ප්‍රකාරව හා විවිධ විශේෂඥ සහය භාවිතා කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය සමඟ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වය සහිතව නවීකරණ කටයුතු අවසන් කරන ලදී.

ශ්‍රී ලාංකීය නාට්‍ය කලාව වෙනුවෙන් රු.මි.372ක වියදමින් මෙම නවිකරණ කටයුතු 2011මැයි මස ආරම්භ කර 2019 ජනවාරි මස 24 වැනි දින නැවත විවෘත කරන ලදී.

නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා

වැඩසටහන් අංශය

නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභ සාධන හා වැඩසටහන් අංශය

2019.01.01 සිට 2019.12.31 දක්වා

01 **සමස්ත ලංකා පාසල් නාට්‍ය තරඟය - 2018**

2019.02.06 සිට 12 දක්වා අවසාන වටයේ තරග විනිශ්චය මරදාන ටවර් රඟහලේ දී පැවැත්වූ අතර, මේ සඳහා නාට්‍ය 40 ක් ඉදිරිපත් වීමට නියමිතව තිබූ නමුත් ප්‍රදර්ශනය කරන ලද්දේ නාට්‍ය 39 ක් පමණි.

02 **සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019**

2019.02.25 දින සිට මේ දක්වා චක්‍රලේඛ 1200 ට ආසන්න සංඛ්‍යාවක් දිවයින පුරා විසිරී ඇති සිංහල හා දෙමළ භාෂිත පාසල් වෙත නිකුත් කරන ලදී.

<u>තරඟය පැවැත්වෙන අංශ (සිංහල මාධ්‍ය පාසල් සඳහා)</u>

- නූර්ති නාට්‍ය ජවනිකා
- කෙටි නාට්‍ය
- දිගු නාට්‍ය

<u>තරඟය පැවැත්වෙන අංශ (දෙමළ මාධ්‍ය පාසල් සඳහා)</u>

- කෙටි නාට්‍ය

<u>සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019 සඳහා අයදුම්පත් එවා ඇති පාසල් සංඛ්‍යාව</u>

- නූර්ති නාට්‍ය ජවනිකා - පාසල් 30
- කෙටි නාට්‍ය - පාසල් 78
- දිගු නාට්‍ය - පාසල් 29
- කෙටි නාට්‍ය (දෙමළ මාධ්‍ය) - පාසල් 07

2019.03.27 දින සමස්ත ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019 සඳහා අයදුම්පත් එවන ලද, නාට්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා මූලික දැනුවත් කිරීමේ රැස්වීමක් මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී පැවැත්වූ අතර, ඒ සඳහා 50 කට ආසන්න පිරිසක් සහභාගී විය.

03 සමස්ත ලංකා දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය තරගය - 2017/18

2019.01.31 හා පෙබරවාරි 01 දිනයන්හි සමස්ත ලංකා දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය තරගය - 2017/18 හි අවසාන වටයේ තරග විනිශ්චයන් මරදාන ටවර් රහහලේ දී පැවැත්විණි. මේ සඳහා පාසල් 14 ක් ඉදිරිපත් වීමට නියමිතව තිබූ නමුත්, ප්‍රදර්ශනය කරන ලද්දේ නාට්‍ය 07 ක් පමණි.

04 රසවින්දනාත්මක ප්‍රසංග පැවැත්වීම

පුත්තලම සිරම්බිඅඩි ප්‍රදේශයේ ජීවත් වන කැෆර් නම් ජනයාගේ සුභ සාධනය වෙනුවෙන් සහ ඔවුන්ටම ආවේණික විශේෂිත කපිරිඤ්ඤා සංගීතය නගා සිටුවීමේ අරමුණින් 2019.02.22 දින පාසල් දර්ශනයක් ලෙස පුත්තලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රසවින්දන වැඩසටහනක් පැවැත්වූ අතර, 250 කට ආසන්න පිරිසක් මේ සඳහා සහභාගී විය.





2019.01.24 දින පැවති එල්ෆින්ස්ටන් රහහල විවෘත කිරීමේ උත්සවයට සමගාමීව ටවර් මියැසි විසිතුර ගී ප්‍රසංගයක් පැවැත්වූ අතර, ශිල්පීන් 13 දෙනෙකු ගීත ගායනය සඳහා එක්විය.

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් හම්බන්තොට වීරවිල දී සංවිධානය කරන ලද යොවුන් පුරය 2019 වැඩසටහනට සමගාමීව 2019.03.29 දින ටවර් මියැසි විසිතුර ගී ප්‍රසංගයක් පැවැත්වූ අතර, ටවර් වාද්‍ය වෘන්දයේ සාමාජිකයින් 06 දෙනෙකු සහ ගායන ශිල්පීන් 10 දෙනෙකු මේ සඳහා සහභාගී විය.

2019.03.21 සිට 24 දක්වා කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි ස්ථාන 03 ක (දිවුලපිටිය, කළුතර, හෝමාගම) නාට්‍ය හා රංගකලාව පිළිබඳ රසවින්දන වැඩසටහන් 03 ක් පැවැත් වූ අතර, මේ සඳහා පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය කලා සංවිධාන වල සාමාජිකයින් ඇතුළු 900 ට ආසන්න පිරිසක් සහභාගී විය.

05 සංයුක්ත තැටි නිෂ්පාදනය කිරීම

නාඩගම් සම්ප්‍රදායේ නාඩගම් ගීත 24 ක් ඇතුළත් සංයුක්ත තැටියක් නිෂ්පාදනය කිරීමට අදාළව 2019.01.18 සිට 2019.02.15 දින දක්වා ගීත පටිගත කිරීමේ කටයුතු සිදුකරන ලදී.

06 කලාකරු සුභ සාධන සේවා

2019.04.09 දින මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී වියපත් කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය පැවැත්වූ අතර, කලාකරුවන් 300 ක් සඳහා ත්‍යාග පිරිනමන ලදී.







පැරණි ටවර් හෝල් ශිල්පීන් හා ජනාධිපති සුභ සාධක අරමුදලින් ප්‍රතිලාභ ලබන ශිල්පීන් 179 ක් සඳහා ජනවාරි මස ද, ශිල්පීන් 178 ක් සඳහා පෙබරවාරි මස ද, ශිල්පීන් 176 ක් සඳහා මාර්තු මස ද දීමනා ලබාදෙන ලදී.

07 එල්ෆින්ස්ටන් රඟහල විවෘත කිරීමේ උත්සවය

2019.01.24 දින නවීකරණයෙන් පසු එල්ෆින්ස්ටන් රඟහල යළි ජනතා අයිතියට පත් කරන ලදී. මෙම අවස්ථාව සඳහා 300 කට අධික පිරිසක් සහභාගී විය.








08 ටවර් වාද්‍ය වෘන්දය

2019.01.24 දින මරදාන එල්ෆින්ස්ටන් රඟහල විවෘත කිරීමේ උත්සවයට සමගාමීව වාද්‍ය ශිල්පීන් 19 ගෙන් සමන්විත ටවර් වාද්‍ය වෘන්දය එළිදැක්වීම සිදුවිය.

09 **නාට්‍ය හා රංගකලා වැඩමුළු පැවැත්වීම**

2019.02.21 සිට 24 දක්වා ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ස්ථාන 10 ක පාසල් සිසුන් සඳහා නාට්‍ය හා රංගකලාව පිළිබඳ එක්දින ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩමුළු පැවැත්වූ අතර, මේ සඳහා සිසුන් 1500 ක් පමණ සහභාගී විය.

10 **කලාකරුවන්ගේ අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය**

2019 අප්‍රේල් මස 09 වැනි දින මරදාන ටවර් රහහලේ දී පැවැති ටවර් හෝල් රහහල පදනම මගින් දීමනා ලබන ශිල්පීන් 58 දෙනෙකු හා ජනාධිපති සුභ සාධක අරමුදල මගින් දීමනා ලබන ප්‍රාසාංගික ශිල්පීන් 118 දෙනෙකු වශයෙන් වියපත් කලාශිල්පීන් 176 දෙනෙකු සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය කිරීම මෙහිදී සිදු විය.

ජ්‍යෙෂ්ඨ ශිල්පීන් විසින් මෙහිදී ගීත ගායනා ඉදිරිපත් කරන ලදී.






11 **වියපත් කලාකරුවන් සඳහා විශ්‍රාම දීමනාව ඉහළ නැංවීම**

ටවර් හෝල් රහහල පදනම මගින් දීමනා ලබන ශිල්පීන් 58 ක් හා ජනාධිපති සුභ සාධක අරමුදල මගින් දීමනා ලබන ප්‍රාසාංගික ශිල්පීන් 118 ක් වූ වියපත් කලාශිල්පීන් 176 දෙනෙකු සඳහා මෙතෙක් ලබාදුන් විශ්‍රාම දීමනාව වන රු. 3000.00 ක මුදල රු. 7500.00 දක්වා වර්ධනය කර 2019 අප්‍රේල් මස සිට ලබාදීම, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ උපදේශකත්වයෙන් 2019 අප්‍රේල් මස 09 වැනි දින මරදාන ටවර් රහහලේ පැවැති කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානෝත්සවයට සමගාමීව සිදුකරන ලදී.

12 ටවර් රහතල පදනමේ නිර්මාතෘ ඇගයුම් උත්සවය

ටවර් හෝල් රහතල පදනමේ නිර්මාතෘ දිවංගත ජනාධිපති, ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ 95 වැනි ජන්ම සංවත්සර සමරු උත්සවය විද්‍යා හා තාක්ෂණ ගරු අමාත්‍ය සුජීව සේනසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 ජුනි 21 දින සවිසරිපාය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මෙහිදී ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිදුන් විසින් රචිත 'රස කවි සිතුවිලි' කාව්‍ය සංග්‍රහයේ පිටපත් පිළිගැන්වීමක් හා එතුමා විසින් රචිත ගී නිර්මාණයන් සඳහා ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ සිසු සිසුවියන් විසින් නර්තනාංග ඉදිරිපත් කිරීමක් ද සිදු විය.

මෙම සමරු උත්සවයේ සමරු දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති, ආචාර් ප්‍රඥිත් අබේසුන්දර මහතා විසින් සිදුකරන ලදී.

මීට සමගාමීව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන පීඨයේ පීඨාධිපති, රාගම දඹුව ලංකාරාමාධිපති, පූජ්‍ය පට්ටියවිල මහින්ද ස්වාමීන් වහන්සේ විසින් එදින පෙරවරුවේ විශේෂ ධර්මදේශනයක් පවත්වන ලදී.

මෙම අවස්ථාව ටවර් හෝල් රහතල පදනම 'සාරස' වෙබ් ගුවන්විදුලිය ඔස්සේ සජීවීව විකාශය කරන ලදී.








13 රසවින්දන වැඩසටහන් පැවැත්වීම

සංස්කෘතික පුනර්ජීවනය - 2019 වැඩසටහනට සමගාමීව 2019 ජුනි 18 හා 24 යන දිනයන්හි කෑගල්ල හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වලදී රසවින්දන වැඩසටහන් 02 ක් පවත්වන ලදී.

මෙහිදී කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩසටහන තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාළ වැඩසටහන ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී.

මෙම වැඩසටහන් සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල රාජ්‍ය නිලධාරීන්, ප්‍රාදේශීය කලා සංවිධාන වල සාමාජිකයින් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ඇතුළත්ව 700 කට අධික සංඛ්‍යාවක් සහභාගී විය.

ගේය පද රචනය හා නාට්‍ය හා රංගකලාව විෂයයට අදාළ ක්ෂේත්‍ර ආවරණය කරමින්, මෙම රසවින්දන වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. රසවින්දන වැඩසටහන සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහානාම වික්‍රමසිංහ මහතා දේශනය සිදුකළ අතර, කථිකාචාර්ය මලිත් අනුරාධ මහතා සහ කථිකාචාර්ය වජිර සුමින්ද මහතා ගායනයෙන් හා වාදනයෙන් සහභාගී විය.






14 කලාකරු සුභ සාධන සේවා

ප්‍රවීණ නාට්‍ය නිෂ්පාදක ප්‍රියන්ත රන්ජන් මහතා වෙත රු. 20,000.00 ක වෛද්‍යාධාර දීමනාවක් 2019.04.01 වැනි දින පිරිනමන ලදී.

ප්‍රවීණ ගායිකා රන්ජනී පෙරේරා මහත්මිය වෙත රු. 20,000.00 ක වෛද්‍යාධාර දීමනාවක් 2019.05.02 දින පිරිනමන ලදී.



ප්‍රවීණ වේදිකා නාට්‍ය පෝස්ටර් ශිල්පී තෝමස් තිලකරත්න මහතා වෙත රු. 20,000.00 ක වෛද්‍යාධාර දීමනාවක් 2019.06.19 දින පිරිනමන ලදී.



15 බොදු බැති ගී ප්‍රසංගය - 2019/08/30 දින

වෙනත් විවිධ වැඩසටහන් මාලාව යටතේ 2019/08/30 වන දින බේරුවල සපුමල් විහාරයේදී බොදු බැති ගී සරණියක් පවත්වන ලදී. එම විහාරයේ විහාරාධිපති වහන්සේ ඇතුළු එම ග්‍රාමයේ දායකයන් විශාල පිරිසක් මේ සඳහා සහභාගි වන ලදී.

16 ටවර් රහහල පදනම සඳහා තේමා ගීතයක් නිර්මාණය කිරීම - 2019/09/06 දින

ටවර් රහහල පදනම සඳහා තේමා ගීතයක් නිර්මාණය වී නොතිබුණ බැවින්, වෙනත් විවිධ වැඩසටහන් යටතේ ටවර් තේමා ගීතයක් නිර්මාණය කිරීම. ඒ සඳහා තේමා ගීතය නිර්මාණය වෙනුවෙන් සුනිල් සරත් පෙරේරා මහතා ද, තනුව හා සංගීත නිර්මාණය වෙනුවෙන් රෝහණ වීරසිංහ මහතා ද, ගායනයෙන් අමරසිරි පීරිස් මහතා ද සම්බන්ධ වන ලදී.

17 **අතීතාවලෝකනය ප්‍රසංගය - 2019/09/20 දින**

ටවර් රහඟල පදනම මගින් දීමනා ලබන කලාකරු වෙනුවෙන් මාසිකව සංවිධානය කරනු ලබන අතීතාවලෝකන ප්‍රසංගය එල්ෆින්ස්ටන් රහඟලේදී ටවර් හෝල් ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

18 **ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය ගඟවට කෝරළය - 2019/09/26 දින**

සාහිත්‍ය මාසය වෙනුවෙන් මහනුවර - කඩවත් සතර - ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය සඳහා ජවනිකා ඇතුළත් ගී ප්‍රසංගයක් පවත්වන ලදී. ප්‍රාදේශීය ලේකම්තුමිය මෙන්ම එහි කාර්ය මණ්ඩලයද සමගින් විශාල ජනතාවක් මෙය නැරඹීම සඳහා සහභාගි වන ලදී.

19 **ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය - 2019/09/27 හා 28 දින**

ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය - 2019 වෙනුවෙන් 27 වන දින නුර්ති ගී ප්‍රසංගයක් ද 28 වන දින මියැසි ගී විසිතුර ප්‍රසංගයක් ද පවත්වන ලදී.

20 **නුර්ති/නාඩගම් ඇතුළු ජවනිකා ප්‍රසංගය - 2019/10/01 දින**

ජාතික වැඩිහිටි දිනය යෙදී තිබුන 2019/10/01 දින වෙනුවෙන් මීරිගම වැඩිහිටි නිවාසයේදී ඔවුන්ගේ රසවින්දනය වෙනුවෙන් නුර්ති/නාඩගම් ගී ඇතුළත් ප්‍රසංගයක් පවත්වන ලදී. මේ සඳහා එම වැඩිහිටි නිවාසයේ සියළුම නේවාසිකයින් සම්බන්ධ වූ අතර, ඔවුන්ගේ මානසික සෞඛ්‍ය වෙනුවෙන් විශේෂ මානසික සෞඛ්‍ය දේශනයක් ද මෙම ප්‍රසංගයට සමගාමීව පවත්වන ලදී.

21 **වැඩිහිටි ගී ප්‍රසංගය - 2019/10/04**

ජාතික වැඩිහිටි දිනය වෙනුවෙන් 2019/10/04 වන දින වේල්ලවීදිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වුණ වැඩිහිටි ගී ප්‍රසංගයක් වෙනුවෙන් ටවර් වාදක ශිල්පීන් ටවර් රහඟලේ අනුග්‍රහයෙන් සම්බන්ධ කර දීම.

22 **ශිල්ප අභිමාණී - 2019 ජනාධිපති සම්මාණ හස්ත කර්මාන්ත තරගය, ප්‍රදර්ශනය සහ අලෙවි පොළ - 2019/10/04 දින.**

උක්ත ප්‍රසංගය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් යුතුව, රංග වස්ත්‍රාභරණ සහිතව නුර්ති ගී ප්‍රසංගයක් BMICH හිදී පවත්වන ලදී.

23 **නුර්ති ගී ප්‍රසංගය - 2019/10/17 දින**

වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරනු ලබන ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය වෙනුවෙන් ටවර් රහඟල පදනම මගින් නුර්ති ගී ප්‍රසංගයක් පවත්වන

ලදී. මේ සඳහා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය සමගින් එහි කාර්ය මණ්ඩලය ද පාසල් සිසුන් ද ඒ අවට ජනතාව ද විශාල පිරිසක් සහභාගි වන ලදී.

24 අතීතාවලෝකනය ප්‍රසංගය - 2019/10/08 දින

ටවර් රහහල පදනම මගින් දීමනා ලබන කලාකරු වෙනුවෙන් මාසිකව සංවිධානය කරනු ලබන අතීතාවලෝකන ප්‍රසංගය ටවර් රහහලේදී ටවර් හෝල් ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී

25 සමස්ථ ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය - 2019/10/03 -2019/11/03 දක්වා

2019/10/03 සිට 2019/11/03 දින දක්වා සති අන්තයෙහි පළාත් වටයෙහි තරඟ විනිශ්චය ඒ ඒ පාසල් හිදි පැවැත් විය.මේ සඳහා තිදෙනකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලය කණ්ඩායම් දෙකක් විනිශ්චය කටයුතුවල නිරත විය .

පළාත් වටය සඳහා කෙටි නාට්‍ය 66ක් දිගු නාට්‍ය 24 ක් නූර්ති නාට්‍ය 26 ක් සහ දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය 11ක් වශයෙන් ඉදිරිපත් විය.

26 සමස්ථ ලංකා සිංහල හා දෙමළ පාසල් නාට්‍ය තරඟය අවසාන වටය සඳහා නාට්‍ය තෝරා ගැනීම - 2019/11/28

2019/11/28 දින පැවති අවසාන වටය සඳහා නාට්‍ය තෝරා ගැනීම හා අවසාන වටය සඳහා කෙටි නාට්‍ය 16ක් දිගු නාට්‍ය 06ක් නූර්ති නාට්‍ය ජවනිකා 06ක් සහ දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය 07ක් වශයෙන් නාට්‍ය 35ක් තෝරා ගන්නා ලදි.

අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ අංශය,

<u>2019 වර්ෂය - වැඩ සටහන් විස්තරය</u>

2019-03-08 දින 2017-2018 දෙවන අධ්‍යයන වර්ෂ සිසුන්ගේ ප්‍රථම වාර පරීක්ෂණය (සිසුන්-33) හා 2016,2017 නැවත පෙනී සිටීමේ සිසුන් 04 දෙනෙකුගේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වුණි.

2019-03-08 සිට 2019-03-18 දක්වා වේබ් රේඩියෝවේ පුහුණු කටයුතු ශබ්දාගාරයේදී පැවැත්වුණි.

2019-03-12 දින 2017-18 මාසික කතිකාවත හා චිත්‍රපට දැක්ම පෙ.ව9.00-දහවල්12.00දක්වා (Children of Heaven) ප්‍රදර්ශනය කෙරිණි. මෙයට අදාළ කතිකාවත කරන ලද්දේ කැලණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ බූපති නලීන් වික්‍රමසිංහ මහතා විසිනි. එදින ප. ව 1.00 - ප. ව 4.00 දක්වා මාසික විශේෂ දේශනය පවත්වන ලදි. ප්‍රවීන ගීත රචක හා සිනමාවේදී මාලක දේවප්‍රිය මහතා විසින් දේශනය පවත්වන ලදි. (හඩ නළුවේ විශේෂතා දේශනය)

2019-03-21 ටවර් මාසික කතිකාවත පැවැත්විණි A Short Film about Love චිත්‍රපටය ප්‍රදර්ශනය කෙරිණි. (වේලාව- පෙ.ව 9 .00 සහ ප.ව 12.00)

මාසික කථිකාවත දේශන මාතෘකාව රංගභූමි අලංකාරණය හා විශ්ව සාක්ෂරතාවය සම්පත් දායකත්වය කථිකාචාර්ය භූපති නලින් මහතා වේලාව - ප.ව 1 .00 සහ ප.ව 4.15 දක්වා පැවැත්විණි.

2019-03-23 සහ 24 වෙබ් රේඩියෝවේ නිවේදක පුහුණු වැඩමුළුව පැවැත්විය. මේ සඳහා 2019-03-23 දින 28 දෙනෙක්ද 2019-03-24 දින 23ක්ද සහභාගි විය.

සම්පත් දායකයින් ලෙස

ප්‍රවීන නිවේදක වසන්ත රෝහණ මහතා	-	2019-03-23
ප්‍රවීන නිවේදක සුමනා ජයතිලක මහත්මිය	-	2019-03-23
ප්‍රවීන නිවේදක චන්දන තිලකරත්න මහතා	-	2019-03-24
ප්‍රවීන නිවේදක චමින්ද ගණරත්න මහතා	-	2019-03-24 සහභාගි විය.

209-03-27 දින ලෝක නාට්‍ය දින උත්සව පා ගමන නෙළුම් පොකුණ රගහලේ සිට එල්ෆින්ස්ටන්රහල දක්වා ඉතා විචිත්‍ර ලෙස ගමන් ගත්හ. පාගමනින් පසු මෙහි උත්සවය එල්ෆිස්ටන් රගහලේදී නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

තවද වෙබ් රේඩියෝව සාරස අන්තර්ජාල ගුවන් විදුලි සේවාව ජනගත කිරීමද සිදු කෙරිණි.

නාට්‍ය හා රංගකලා පාසලේ වාර්ෂික අධ්‍යයන කාර්යක් ලෙස නාට්‍ය හා රංගකලා පාසලේ 2016/2017 විද්‍යාර්ථයින් සඳහා නිෂ්පාදනය කෙරෙන **සඟිරි දියවර** නාට්‍ය පුහුණුවීම් කටයුතු මාර්තු මාසයේ සිට ආරම්භ කර ඇත.අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩ සටහන්) ආචාර්ය සමන් සොයිසා මහතා විසින් මෙහි අධ්‍යක්ෂ කටයුතු සිදු කරනු ලබයි.

2019 මැයි මස 2017/ 2018 සිසුන් සඳහා සංවිධානය කරන ලද ධාරිතා නායකත්ව හා ධාරිතා පුහුණු වැඩසටහන මැයි මස 04 දින සිට 12 වැනි දින දක්වා කුඩාඔය විශේෂ කාර්ය බලකා කඳවුරේදි පැවැත්විය.

2019 මැයි 29 වන දින ප.ව 1.00 සිට ප.ව 4.00 දක්වා මාසික කතිකාවත වැඩසටහන සව්සිරිපාය ශ්‍රාවණාගාරයේ දි පැවැත්විය. මේ සඳහා සම්පත් දායකත්වය කැලණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය බූපති නලීන් වික්‍රමසිංහ මහතා විසිනි.

2019 මැයි 29 වන දින පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා මාසික විශේෂ දේශනය වැඩසටහන සවිසිරිපාය ශ්‍රාවණාගාරයේ දී පැවැත්විය. මේ සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලද්දේ ප්‍රවීණ සංගීතඥ ජයන්ත අරවින්ද මහතා විසිනි.

2019 ජුනි මස 2018/2019 සිසුන් ප්‍රථම අධ්‍යන වර්ෂයේ ප්‍රථම ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු 2019.06.03 දින නාට්‍ය පාසල් පරිශ්‍රයේ පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා පැවැත්විණි. සිසුන් 37 ක් මේ දක්වා සහභාගිවිය.

ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ දෙවර්ෂ පූර්ණකාලීන නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවට 2019/2020 සිසුන් බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල 2019.06.20 වන දින විභාග දෙපාර්තමේන්තුව මඟින් අප වෙත ලබාදුන් අතර එහි ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු ටවර් හෝල් රහඟල පදනම ප්‍රධාන කාර්යාලයේදී 2019.07.13 සහ 14 දින පැවැත්වීමට නියමිතය.

විශ්ව විද්‍යාල නාට්‍ය උළෙල සඳහා ඉසව් කළමණාකරන ආයතනය තෝරා ගැනීමේ මූලික රැස්වීම 2019.06.03 දින අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විය.

තවද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා රංගකලා අධ්‍යාපනවේදී උපාධිය හැදෑරීම සඳහා දෙවර්ෂ පූර්ණ කාලීන ඩිප්ලෝමා සාර්ථකව අවසන් කල 2016/2017 සිසුන් 29කුගේ නම් ලැයිස්තුව 2019.06.12 දින ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය පීඨාධිපති මහාචාර්ය ශිරෝනිකා පී කරුණානායක මහත්මිය වෙත යවන ලදි.

2019 මැයි 24 වන දින පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා මාසික විශේෂ දේශනය හා මාසික කථිකාව හා චිත්‍රපටි දැක්ම සවිසිරිපාය ශ්‍රාවණාගාරයේ දී පැවැත්විය. මේ සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලද්දේ ජේ්යෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක මහතා විසිනි.

2019 භාත් ඛණ්ඩ විභාග ඉල්ලුම් කිරීමට අදාල අයදුම්පත් මෙම දිනවල නිකුත්කෙරේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.07.31 වේ.

වෙබ් රේඩියෝ පහත වැඩසටහන් 2019.06.25 දින සහ 2019.06.28 දින ශබ්දාගාරයේදී පටිගත කෙරිණි.(ප.ව 2.45 සිට ප.ව 4.00 දක්වා)

01 ලියක මහිම වැඩසටහන - රම්‍ය ශ්‍රියාණි පතිරණ මහත්මිය - (2019.06.25)

02 සංගීත රස චින්දන වැඩසටහන - ශ්‍රිමලී කපුරුපක්ෂ මහත්මිය - (2019.06.28)

නාට්‍ය හා රංග කලා පාසලේ වාර්ෂික අධ්‍යයන කාර්යයක් ලෙස නාට්‍ය හා රංග කලා පාසලේ 2016-2017 විද්‍යාර්ථීයින් සඳහා නිෂ්පාදන කෙරෙන සගිරි දියවර නාට්‍ය පුහුණුවීම් කටයුතු මාර්තු මාසයේ සිට මේ දක්වා සිදුකෙරේ. අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන හා වැඩසටහන්) අචාර්ය සමන් සොයිසා මහතා විසින් මෙහි අධ්‍යක්ෂ කටයුතු සිදු කරනු ලබයි.

2019 භාත් ඛණ්ඩ විභාග ඉල්ලුම් කිරීමට අදාල අයදුම්පත් මෙම දිනවල නිකුත්කෙරේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.07.31 වේ මේ වන විට අයදුම්පත් 116 ක් නිකුත් කර ඇත.

2019.07.01 දින මඩු ප්‍රදේශයේ පැවති වැඩ සටහන සඳහා වේබ් රේඩියෝවේ පටිගත කිරීමේ රාජකාරි කටයුතු සඳහා පහත මහතුන් සහභාගි විය.

ක්‍රිස්ටි ප්‍රනාන්දු මහතා - ශබ්දාගාරය

චමීර සූසිත මහතා - පාලන අංශය

ලක්මාල් ගමගේ මහතා - අධ්‍යාපන පර්යේෂණ හා පර්යේෂණ අංශය

රංජිත් බංඩාර මහතා - නාට්‍ය පාසලේ ශිෂ්‍ය

2017 – 2018 දෙවන අධ්‍යන වර්ෂයේ දෙවන අධ්‍යයන වාරයේ ලිඛිත පරීක්ෂණ නාරාහේන්පිට පරාක්‍රමබාහු විද්‍යාලයේ දී 2019.07.08 වන දින සිට 2019.07.11 දින දක්වා ප.ව 2.00 සිට ප.ව 5.00 දක්වා පැවැත්වුණි මේ සඳහා සිසුන් 34 දෙනෙකු සහභාගිවිය.

2018/2019 ප්‍රථම අධ්‍යයන වර්ෂයේ දෙවන වාර පරීක්ෂණ නාරේහේන්පිට පරාක්‍රමබාහු විද්‍යාලයේදි 2019.07.08 වන දින සිට 2019.07.11 දින දක්වා ප.ව 2.00 සිට ප.ව 5.00 දක්වා පැවැත්විණි. මේ සඳහා සිසුන් 37 දෙනෙකු සහභාගිවිය.

2019.08.16 භාත් ඛණ්ඩ විභාගයේ අයදුම්පත් ඉන්දියාවේ භාත් ඛණ්ඩ සංගීත විද්‍යාපීඨය වෙත යැවීම.

2019.08.19 දින 2019/2020 සඳහා ටවර් හෝල් නාට්‍ය හා රංග කලා පාසලට පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 40 දෙනෙකු ඇතුලත් කර ගැනීම.

2019.08.20 දින සිට 2019.08.23 දක්වා බඳවාගත් සිසුන් සඳහා දිශාමුඛකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

2019.08.22 දින බඳවාගත් සිසුන් සඳහා දිශාමුඛ කිරීමේ වැඩසටහන සමගාමීව හැම්ලට් නාට්‍ය වේදිකා ගත කිරීම.

2019.08.29 වන දින 2019 හා 2020 අධ්‍යයන වර්ෂයන් හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා මාසික විශේෂ දේශනය මහාචාර්ය සුමනපාල ගල්මංකඩ මහතා පැවැත්වීම හා මාසික චිත්‍රපට දැක්ම හා කථිකාව කැළණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය බූපති නලීන් වික්‍රමසිංහ මහතා විසින් පවත්වන ලදි.

2019 සැප්තැම්බර් 10 දින සරසවිපාය පරිශ්‍රය තුළ භාත් ඛණ්ඩ විභාග සඳහා පුහුණු පන්ති ආරම්භකිරීමට අදාළ මූලික සාකච්ඡා පැවැත්වීම.

2019 සැප්තැම්බර් 18/19 දින නාට්‍ය ප්‍රවර්ධන,කලාකරු සුභසාධන හා වැඩසටහන් අංශය නිෂ්පාදිත නාඩගම් ගීත ඇතුලත් සංයුක්ත තැටියේ ගුණාත්මක බව විද්වත් කමිටුවක් මඟින් පරීක්ෂා කිරීම.

2019 සැප්තැම්බර් 20/29 කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයෙන් රු 75000/- ක පොත් මිළදි ගැනීම.

2019 සැප්තැම්බර් 23 දින නාට්‍ය හා රංගකලා සිසුන් කොළඹ මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබාදීමට මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම.

2019 සැප්තැම්බර් 24 දින රුක්මණි දේවි අනුස්මරණ ග්‍රන්ථ සම්පාදනය නැමැති කෘතිය මුද්‍රණය කිරීම හා ප්‍රකාශනයට අදාළ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

2019 සැප්තැම්බර් 24 දින පුංචි අපට දැන් තේරෙයි හා තොප්පි වෙළෙන්දා නැමැති කෘතින් දෙමළ භාෂාවට පරිවර්තනය කර කෘතින් මුද්‍රණය කිරීම හා ප්‍රකාශනයට අදාළ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

2019.10.15 දින නාට්‍ය ප්‍රවර්ධන,කලාකරු සුභසාධන හා වැඩසටහන් අංශය නිෂ්පාදිත නාඩගම් ගීත ඇතුලත් සංයුක්ත තැටියේ ගුණාත්මක බව විද්වත් කමිටුවක් මඟින් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම. කමිටු සාමාජිකයින් ලෙස,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහානාම වික්‍රමසිංහ මහතා ,කථිකාචාර්ය වාද්‍ය විශාරද ශාන්ත සෙනරත් යාපා මහතා ,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශාස්ත්‍රපති රශ්මි සංගීතා මහත්මිය පත්විය.

2019.10.15,16 2017/2018 නාට්‍ය පාසලේ සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණයේ රංගනයට අදාල ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු එල්ෆින්ස්ටන් රහහලේදි පැවැත්විණි.

2019.10.16 දින කෞතුකාගාරයක් සහිත ප්‍රදර්ශනාගාරයක් ටවර් රහහලේ දැවමය උඩු මහලේ ස්ථාපිත කිරීමට අදාළ මූලික සාකච්ඡාවක් පැවැත්වීම.

2019.10.17 වන දින 2019 හා 2020 අධ්‍යයන වර්ෂයන් හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා මාසික විශේෂ දේශනය ප්‍රධාන පොලිස් පරීක්ෂක එම් ඒ රංජිත් මුණසිංහ මහතා

පැවැත්වීම හා මාසික චිත්‍රපට දැක්ම හා කථිකාව කැළණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය බූපති නලීන් වික්‍රමසිංහ මහතා විසින් පවත්වන ලදි.

2019.10.18 දින මනෝ වෛද්‍ය මහාචාර්ය ප්‍රියන්ත ගාමිණී ජයසිංහ මහතා සමඟ වෙබ් රේඩියෝ පටිගත කිරීමක් සිදු කිරීම. සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණයේ රංගනයට අදාල ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු එල්ෆින්ස්ටන් රඟහලේදි පැවැත්විණි.

2019.10.21 දින Big Bad Wolf පොත් ප්‍රදර්ශනයෙන් නාට්‍ය හා රංග කලා පාසලේ පුස්තකාලය වෙත රු 75000/- ක පොත් මිළදි ගැනීම.

2019.10.29 දින හෙද නිළධාරි ජ්‍යෙෂ්ඨ මනෝ චිකිත්සක ආචාර්ය කුමාරි ගල්පොල මහත්මිය සමඟ මනෝ වෛද්‍ය සාකච්ඡාවක් වෙබ් රේඩියෝව මඟින් පටිගත කිරීම.

2019.10.29 දින හෙද නිළධාරි ජ්‍යෙෂ්ඨ මනෝ චිකිත්සක ආචාර්ය කුමාරි ගල්පොල මහත්මිය සමඟ මානසික සතුට හා එහි වැදගත්කම පිළිබඳ දේශනය වෙබ් රේඩියෝව හරහා සජීව විකාශය.

2019.10.30 දින නාට්‍ය කෞතුකාගාරයක් සහිත ප්‍රදර්ශනාගාරයක් ටවර් රඟහලේ දැවමය උඩු මහලේ ස්ථාපිත කිරීමට අදාළ දෙවන සාකච්ඡාව පැවැත්වීම.

2019.11.05 දින 2017/2018 සිසුන්ගේ දෙවන අධ්‍යන වර්ෂ දෙවන වාර අවසන් ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්විණි.

2019.11.07 දින කාර්ය මණ්ඩල පුස්තකාලය වෙත රු 50000/- ක පොත් මිළදි ගැනීම.

2019.11.14 වන දින 2019 හා 2020 අධ්‍යයන වර්ෂයන් හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා මාසික විශේෂ දේශනය ජ්‍යෙෂ්ඨ මනෝ උපදේශිකා හා මනෝ චිකිත්සක කුමාරි ගල්පොල මහත්මිය පැවැත්වීම හා මාසික චිත්‍රපට දැක්ම හා කථිකාව කැළණිය විශ්ව විද්‍යාලයේ ලලිත කලා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය බූපති නලීන් වික්‍රමසිංහ මහතා විසින් පවත්වන ලදි. 2019.11.15 දින සිට 2019 දෙසැම්බර් මස 18 දින සිට 28 දින දක්වා පැවැත්වෙන භාත් ඛණ්ඩ විභාගයේ ලිඛිත පරීක්ෂණ විභාගය පැවැත්වීම.

2019.12.04,05,06 තෙදින නාට්‍ය හා රංගකලා පාසලේ නේවාසික වැඩමුළුව මීගොඩ සම්පත් මධ්‍යස්ථානයේදි පැවැත්වීම.

සම්පත් දායකත්වය
- ශ්‍රියන්ත මෙන්ඩිස් මහතා
- ප්‍රදීප් චන්ද්‍රසිරි මහතා
- ප්‍රියංකර රත්නායක මහතා

2019.12.16,17,18,19,20 හා 23 දින 2018/2019 අධ්‍යයන වර්ෂයේ දෙවන අධ්‍යනවාර ප්‍රථමවාර පරීක්ෂණය (ලිඛිත) පවත්වන ලදි. මේ සඳහා සිසුන් 37 දෙනෙකු නාරහේන්පිට පරාක්‍රමබාහු විද්‍යාලයේදි පෙනී සිටින ලදි. 2020 අධ්‍යයන වර්ෂයේ සිසුන් 40 දෙනෙකු මෙදින පැවති ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගිවිය.

2019.12.10,13,15 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ පුවත්පත් දැන්වීම් පළ කිරීම.

2019.12.18 දින සිට 2019 දෙසැම්බර් 28 දින දක්වා භාත්ඛණ්ඩ ලිඛිත විභාගය පැවැත්වීම.

ටවර් හෝල් රඟහල පදනම

2019 වර්ෂය සඳහාවූ මුල්‍ය ප්‍රකාශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ජාවප/බී/වීඑඩවීඑස්/01/2019/156 මගෙ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 ජූලි 15 දින

අධ්‍යක්ෂ ජනරාල්
වවර්හෝල් රහතල පදනම

වවර්හෝල් රහතල පදනමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

වවර්හෝල් රහතල පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2016 වර්ෂයේදී පැවති ඉඩම් හා ගොඩනැගිලි වලින් ප්‍රධාන කාර්යාලීය ඉඩම හා ගොඩනැගිලි පමණක් පිළිවෙලින් රු.614,000,000 කට හා රු.163,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබූ අතර අගය රු.328,000,000 ක් වූ ඉඩම් හා රු.234,023,047 ක් වූ ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ඉහත ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ප්‍රවේණිගත වත්කම් ලෙස හඳුනාගෙන තිබූ රු.123,825,922 ක්වූ ටවර්හෝල් රඟහල සහ රු.95,579,894 ක්වූ එල්ෆින්ස්ටන් රඟහල ප්‍රමිතයේ 10 ඡේදය ප්‍රකාරව ක්ෂය කර නොතිබූ අතර ප්‍රමිතයේ 11 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කර ද නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කර තිබූ කැබ් රථයක වටිනාකම 2019 ජනවාරි 01 දින ගිණුම්ගත කිරීමේදී ප්‍රමිතයෙහි 25 හා 43 ඡේද ප්‍රකාරව වත්කම අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම වෙනුවට 2017 වර්ෂයේ රක්ෂණ කටයුතු සඳහා අගය කළ වටිනාකම වූ රු.4,000,000 පිරිවැය ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. පදනම සතුව වාහන 11ක් පැවති අතර ඉහත ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව ඉහත වාහනය ද ඇතුළු වාහන 08 ක් රක්ෂණය කිරීම සඳහා පමණක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව 2019 අගෝස්තු 01 දින ලබාදී තිබූ තක්සේරු අගය අදාල වාහනවල එදිනට ප්‍රත්‍යාගණිත වටිනාකම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව සංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු. 29,504,473 ක් වූ වාහන 09 ක ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2019 ජනවාරි 01 දිනට පිරිවැය රු.161,750,000 ක් වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු.1,250,000 ක් වූ ශබ්දාගාරය 2017 වර්ෂයේ සිට ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.16,300,000 ක් හා සමුච්චිත ක්ෂය රු.48,900,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඊ) එකතුව රු.1,414,650 ක් වූ ණයගැති ශේෂ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් හා රු.20,735 ක් සංස්කෘතික අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය වාර්තාවල දක්වා තිබුණද එම ආයතනවල එවැනි ගෙවිය යුතු ශේෂ නොපවතින බව එම ආයතන විසින් තහවුරු කර තිබුණි.මේ අනුව මෙම අගයන් නැවත ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(උ) පාරිතෝෂික වෙන්කිරීම් රු.21,873,938 ක් සංචිත වශයෙන්ද වර්ෂයක කාලයක් සඳහා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.191,317,911 ක් ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ක්ෂය වටිනාකම රු.1,412,950ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණි.

(එ) වසර ගණනාවක් තිස්සේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන එකතුව රු.79,091,701 ක් වූ ශේෂයන් 5 ක් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පදනමේ 2019 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන පදනමේ 2019 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ වෙනතුන් නොරතුරු ලබා ගත නැති වූ විට කියවීම සහ එසේ කිරීමේදී යම්තාක් නොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම් අතුරෙ ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පදනමේ 2019 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම් ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාධාරණ ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාධාරණ ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි නෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාධාරණ ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැනසුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාධාරණ ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාධාරණ ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය

කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ විගණන මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා හලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2(ඊ), 2.2.2(අ) සහ 2.2.2(ඇ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති,රීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	1978 අංක 1 දරන වවර්හෝල් රහහල පදනම පනතේ 8 වෙනි වගන්තිය හා පදනම සතු සවිසිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන්	මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සවිසිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 381(1)	පදනම සතු ජංගම ගිණුම් දෙකක් සහ ඉතිරි කිරීමේ ගිණුම් දෙකක් ආරම්භ කිරීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණද, භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2021 මාර්තු 04 දිනදීය.
(ඈ)	අංක 03/2015 දරන 2015 ජූලි 14 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය	අවස්ථා 04 කදී රු.100,000 ඉක්මවා එකතුව රු.997,177ක අතුරු අග්‍රිම ලබාදී තිබූ අතර එහිදී එක් නිලධාරියෙකුට එක් දිනකදී එකතුව රු.571,000 ක් වූ අත්තිකාරම් 02ක් ලබාදී තිබුණි. අවශ්‍යතාව සලකා බැලීමෙන් තොරව අත්තිකාරම් ලබාදීම නිසා අවස්ථා 20 කදී ලබාදී තිබූ රු.896,625 ක මුළු අත්තිකාරම් මුදලෙන් රු.405,012 ක් එනම් සියයට 32සිට සියයට 64 අතර ප්‍රමාණයක් ආපසු පියවා තිබුණි.

(අ)	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/01-2019 හා 2019 ජනවාරි 12 දිනැති චක්‍රලේඛයේ 5.3 ඡේදය	සමාලෝචිත වර්ෂයට අදාළව එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.
(ආ)	අංක 02/2015 හා 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04(අ) වගන්තිය	ලියාපදිංචි කළ වසර 10 ක් ගතවීමට පෙර මෝටර් රථයක් අපහරණය කර තිබූ අතර ඒ සඳහා විශේෂ පරීක්ෂණ මණ්ඩලයක් මගින් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස නටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර පදනමේ සමහත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

